# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1853/49 - 2014 මාර්තු මස 14 වැනි සිකුරාදා - 2014.03.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී - 3/2014

**1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතේ 29 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 ජනවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2014 අංක 1 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2014 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

2. පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද (මෙහි මින්මතු "යෝජනා ක්‍රමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට බැඳීමට අදහස් කරනු ලබන සෑම ගොවියකු ම -

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(ආ) යෝජනා ක්‍රමයට බැඳීම සඳහා පනතේ 4 වැනි වගන්තිය යටතේ සුදුස්සකු විය යුතු ය.

(ඇ) (i) හිමිකරුවකු, බදුකරුවකු, අඳ ගොවියකු හෝ හිමිකරුවකුගේ අධිකාරිය යටතේ වගා කරනු ලබන තැනැත්තෙකු සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත හෝ (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත හෝ රජයේ (460 වන අධිකාරය වූ) ඉඩම් ආඥාපනත යටතේ බලයලත් නිලධරයකු විසින් ගොවියකු වශයෙන් තහවුරු කරන ලද තැනැත්තෙකු විය යුතුය ; හෝ

(ඇ) (ii) මුදලින් හෝ ද්‍රව්‍යවලින් වේතන ලබන (i) වන අනු - ඡේදයේ සඳහන් තැනැත්තෙකුගේ සේවා නියුක්තයකු වන තැනැත්තෙකු විය යුතුය ; සහ

(ඉ) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන යම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක හෝ 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථ සාධක අරමුදල යටතේ ප්‍රතිලාභ ලබන අයකු නොවිය යුතු ය.

3. (1) 2 වන නියෝගය යටතේ නියම කර ඇති සුදුසුකම් සපුරා ඇති යම් ගොවියකු (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ඒ වෙනුවෙන් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම කාර්යය සඳහා වන ආකෘති පත්‍රය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, එම ආකෘති පත්‍රය යෝජනා ක්‍රමය සඳහා ඉල්ලුම්කරුවන්ට සාමාජිකත්වය ප්‍රදානය කිරීම සහතික කිරීම සඳහා, (මෙහි මින්මතු "බලයලත් නිලධාරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලය විසින් නිසි පරිදි බලය පවරනු ලැබූ නිලධරයකු වෙත තිබිය යුතු ය.

(2) ඉල්ලුම් පත්‍රය ලැබුණු විට, බලයලත් නිලධරයා විසින් එහි සඳහන් විස්තරවල නිරවද්‍යභාවය නිශ්චිතව තහවුරු කරගනු ලැබිය යුතු අතර, ඉල්ලුම්කරුට යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ප්‍රදානය කිරීම සහතික කරනු ලැබිය යුතු ය.

(3) බලයලත් නිලධරයා විසින් ඉල්ලුම් පත්‍රය ඉතා සැලකිල්ලෙන් පරීක්ෂාවට ලක් කළ යුතු අතර, එය ඔහුගේ සහතිකය සමග මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

4. (1) යම් ඉල්ලුම්කරුවකුගේ ඉල්ලීම මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ විට, ඔහු (මෙහි මින්මතු "දායකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) යෝජනා ක්‍රමයේ දායකයකු බවට පත්වන අතර, මණ්ඩලය විසින් එවැනි සෑම ඉල්ලුම්කරුවකුට ම සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) 3 වන නියෝගය යටතේ යම් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමට මණ්ඩලය විසින් තීරණය කරනු ලැබූ විට, එකී තීරණය සඳහා වූ හේතු සඳහන් කරමින් එම තීරණය එහි ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු ය.

5. (1) යම් දායකයකුගේ සහතිකය මණ්ඩලය විසින් පහත දැක්වෙන යම් හේතුවක් මත අවසන් කරනු ලැබිය හැකිය :-

(අ) 3 වන නියෝගය යටතේ ඔහු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමේ එම දායකයා විසින් සඳහන් කර ඇති තොරතුරුවල යම් වැදගත් කරුණක් අසත්‍ය හෝ වැරදි සහගත බව සොයා ගනු ලැබූ විට හෝ එහි සඳහන් යම් දෙයක් සත්‍ය ලෙස සඳහන් කර නොමැති විට හෝ යම් වැදගත් තොරතුරක් සඳහන් කර නොමැති නම්,

(ආ) යෝජනා ක්‍රමයේ දායකයකු ලෙස සිටීමට දායකයා සුදුස්සකු බවට පත්කරනු ලැබූ යම් සුදුසුකමක් එම දායකයාට අහිමි වී ඇත්නම්,

(ඇ) මෙම නියෝග ප්‍රකාර හෝ ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය ප්‍රකාර දායකයාගෙන් අයවිය යුතු දායකයාගෙන් මුදල් ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලැබ ඇත්නම් හෝ එම දායක මුදල් ගෙවීම සඳහා ඔහු වෙත ලබා දී ඇති යම් වැඩි දුරටත් වූ කාලසීමාවක් තුළ ඒ මුදල් ගෙවීම පැහැර හරිනු ලැබ ඇත්නම්,

(2) (1) වන ඡේදය යටතේ මණ්ඩලය විසින් සහතිකය අවසන් කරනු ලැබූ විට, අදාළ දායකයා විසින් දායක මුදල් වශයෙන් ගෙවන ලද සියලු මුදල් රාජ්‍ය සන්තක කරනු ලැබිය යුතු අතර මෙම නියෝග යටතේ එම දායකයා වෙත ප්‍රදානය කරනු ලබන යම් සහනයකට යටත්ව මණ්ඩලයේ දේපළක් බවට පත්විය යුතු ය.

6. (1) මෙහි "අ" උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව සඳහන් වයසෙහි දී යෝජනා ක්‍රමයට බැඳෙන යම් දායකයකු -

(අ) එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූපී සටහන් නිශ්චිතව සඳහන් එකවර ගෙවන මුදල හෝ

(ආ) එම උපලේඛනයේ III වන තීරයේ නිශ්චිතව සඳහන් යම් මුදලක් මාසික වාරිකයක් වශයෙන් ; හෝ

(ඇ) එම උපලේඛනයේ IV වන තීරයේ නිශ්චිතව සඳහන් යම් මුදලක් අර්ධ වාර්ෂික වාරිකයක් වශයෙන්

ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන ඡේදයේ සඳහන් දායක මුදල් ගෙවනු ලබන යම් දායකයකු "ආ" උපලේඛනයේ II වන තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති යම් මුදලක්, එම උපලේඛනයේ I වන තීරයේ අනුරූපි සටහනෙහි නිශ්චිතව දක්වා ඇති වයස සම්පූර්ණ කිරීමත් සමඟ විශ්‍රාම වැටුපක් වශයෙන් ලැබීම සඳහා හිමිකම් ලැබිය යුතු ය.

7. (1) සෑම දායකයකු විසින්ම ඔහු වෙත නිකුත් කරන ලද සහතිකයේ නිශ්චිතව දක්වා ඇති දින හෝ ඊට පෙර ඔහුගෙන් අයවිය යුතු වාරික මුදල් ගෙවනු ලැබිය යුතු ය.

එසේ වුව ද, එවැනි යම් වාරික මුදලක් ගෙවීම සඳහා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සහන කාලසීමාවක් ප්‍රදානය කරනු ලැබිය හැකිය.

(2) යම් දායකයකු විසින් ගෙවිය යුතු යම් වාරික මුදලක්, සහන කාලසීමාව තුළ දී ගෙවනු ලැබූ විට ඔහු වෙත අයවිය යුතු විශ්‍රාම වැටුප සඳහා කිසිදු වෙනසක් සිදු නොකළ යුතු ය.

(3) යම් දායකයකු විසින් සහන කාලසීමාව ඉකුත්වීමෙන් පසුව යම් වාරික මුදලක් ගෙවනු ලැබූ විට, එම වාරික මුදල ගෙවීම පැහැර හැර ඇති බවට සලකනු ලැබිය යුතු අතර, එම දායකයා වෙත මෙම නියෝග යටතේ නිශ්චිතව සඳහන් යම් සහනයක් හැර වෙනත් කිසිදු ගෙවීමක් නොකළ යුතු ය.

(4) දායකයකු විසින් වාරික මුදල් ගෙවිය යුතු දිනට පෙර ඕනෑම වාරික සංඛ්‍යාවක් ගෙවනු ලැබිය හැකි ය.

8. (1) මෙම නියෝගවල නිශ්චිතව දක්වා ඇති ඔහුගෙන් අයවිය යුතු දායක මුදල්, අනුගාමී වාරික පහක් ගෙවීම දායකයකු විසින් පැහැර හැර ඇති විට එම දායකයාගේ සහතිකය අවලංගු වන්නේ ය.

(2) එම දායකයාගේ සහතිකය නැවත වලංගු කරනු නොලැබිය යුතු නමුත් 9 වන නියෝගයේ විධිවිධානවලට යටත්ව ඔහු විසින් ගෙවන ලද සම්පූර්ණ දායක මුදල් ආපසු ලබා ගැනීමට හිමිකම ලැබිය යුතු ය.

(3) (1) වන ඡේදයේ සඳහන් දායකයා ඔහු විසින් ගෙවීම පැහැර හරිනු ලැබූ පස්වන වාරිකය ගෙවීමට නියමිත දිනයට පෙරාතුව ස්ථිර අබලතාවයකට පත් වූ හෝ මරණයට පත් වූ අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි-

(අ) මෙම නියෝගවල 10 වැනි නියෝගය යටතේ නිශ්චිතව දක්වා ඇති අබලතාවයකට පත්වීම මත එකවර ගෙවන මුදලක පාරිතෝෂිකයක් ඔහුට ගෙවනු ලැබීමට ; හෝ

(ආ) මෙම නියෝගවල 10 වැනි නියෝගය යටතේ නිශ්චිතව දක්වා ඇති මරණ පාරිතෝෂිකයක් ඔහුගේ මරණය සිදුවීම මත ඔහුගේ නීත්‍යානුකූල උරුමකරුවන් වෙත ගෙවනු ලැබීමට,

හිමිකම් ලැබිය යුතු ය.

9. (1) යම් දායකයකු යෝජනා ක්‍රමය යටතේ දායක මුදල් ගෙවිය යුතු මුළු කාලසීමාව සඳහා අයවිය යුතු සියලු වාරික මුදල් 6 වන නියෝගයේ විධිවිධාන ප්‍රකාරව සම්පූර්ණයෙන් ගෙවනු ලැබ ඇති විට හෝ එකවර මුදල් ගෙවීම මගින් යෝජනා ක්‍රමයට බැඳී ඇති විට, මෙම නියෝගවල "ආ" උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතය දක්වා ඇති විශ්‍රම වැටුප වයස අවුරුදු හැට (60) සම්පූර්ණවීමත් සමගම ලබාගැනීමට හිමිකම් ලබන්නේ ය.

(2) යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට සුදුසුකම් ලැබීමෙන් පසු නමුත් යෝජනා ක්‍රමය යටතේ යම් ගෙවීමක් ලබා ගැනීමට පෙර යම් දායකයෙක් මිය ගිය විට එම දායකයාගේ නීත්‍යානුකූල උරුමකරුවන්ට එම දායකයා මිය ගිය දින සිට වසර එකක කාලසීමාවක් තුළ රජය විසින් ගෙවන ලද සහනාධාර අඩු කිරීමෙන් පසු දායක මුදල් වශයෙන් එම දායකයා විසින් ගෙවන ලද සම්පූර්ණ මුදල ලබා ගැනීමට පමණක් හිමිකම් ලැබිය යුතු ය.

(3) යම් දායකයකු මෙහි "අ" උපලේඛනය යටතේ හෝ ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය ප්‍රකාර ඔහු විසින් ගෙවිය යුතු මුලු දායක මුදලින් සියයට විසිපහකට (25%) අඩු ප්‍රමාණයක් ගෙවා ඇති විට මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට හෝ මේ නියෝගය යටතේ ඔහු විසින් ගෙවන ලද සම්පූර්ණ දායක මුදල් ආපසු ලබාගැනීමට හිමිකම් නොලබන්නේ ය.

(4) මෙහි "අ" උපලේඛනය යටතේ හෝ දායකයාට නිකුත් කර ඇති සහතිකය ප්‍රකාර දායකයකු විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදලේ සම්පූර්ණ ප්‍රමාණයට වඩා අඩුවෙන් දායක මුදල් ගෙවා ඇති නමුත්, ඒ සම්පූර්ණ දායක මුදල් ප්‍රමාණයෙන් සියයට විසිපහක (25%) ප්‍රතිශතයක් හෝ ඊට වැඩියෙන් ගෙවා ඇති දායකයකු, ඔහු විසින් ගෙවා ඇති සම්පූර්ණ දායක මුදල් ප්‍රමාණය සමග ඒ මත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පොලිය ආපසු ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ය.

(5) 5(ආ) වන නියෝගය යටතේ ස්වකීය සහතිකය අවසන් කරනු ලැබූ යම් දායකයකු, එසේ සහතිකය අවසන් කරනු ලැබීමෙන් වසර දෙකක් ඉකුත් වීමෙන් පසුව, ඔහු විසින් ගෙවනු ලැබූ සම්පූර්ණ දායක මුදල සමඟ මණ්ඩලය විසින් ඒ මත නිශ්චය කරනු ලබන පොළිය ආපසු ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ය.

(6) 5(අ) නියෝගයේ සඳහන් කර ඇති හේතුවක් මත දායකයන් වීම අවසන් වී ඇති තැනැත්තන් නොවන, සහතිකය අවසන් කරනු ලැබ ඇති සෑම දායකයකු ම, 2 වන නියෝගයේ විධිවිධානවලට අනුව, නව සාමාජිකයන් වශයෙන් යෝජනා ක්‍රමයට බැඳීමට සුදුස්සන් වන්නේ ය.

10. (1) අබලතාවයකට පත්වීම මත එකවර ගෙවන මුදල් පාරිතෝෂිකයක් සහ මරණ පාරිතෝෂියක් ලබා ගැනීමට යෝජනා ක්‍රමයේ දායකයකු හිමිකම් අමතර දායක මුදලක් නොගෙවාම ලබන්නේ ය.

(2) 3 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි යෝජනා ක්‍රමයට බැඳුණු දායකයකු යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට සුදුස්සකු බවට පත්වීමට පෙරාතුව මරණයට පත් වූ හෝ අර්ධ හෝ පූර්ණ අබලතාවයකට පත් වූ අවස්ථාවක දී-

(අ) මෙහි "ඇ" උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වයසේ දී ස්ථිර පූර්ණ අබලතාවයක පත් වූ විට, එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති එකවර ගෙවන මුදල් පාරිතෝෂිකයක් සඳහා ;

(ආ) මෙහි "ඇ" උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වයසේ දී ස්ථිර අර්ධ අබලතාවයකට පත් වූ විට එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති එකවර ගෙවන මුදල් පාරිතෝෂිකයක් සඳහා ;

(ඇ) මෙහි "ඇ" උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වයසේ දී දායකයා මරණයට පත් වූ විට, එම උපලේඛනයේ IV වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති මරණ පාරිතෝෂිතයක් ඔහුගේ නීත්‍යානුකූල උරුමකරුවන්ට ගෙවනු ලැබීමට

හිමිකම් ලබන්නේ ය.

(3) (2) වන ඡේදයේ දක්වා ඇති එකවර ගෙවන මුදල් පාරිතෝෂිකය දායකයකුගේ ජීවිත කාලය තුළ එක්වරක් පමණක් ගෙවනු ලැබිය යුතු අතර, අබලතාවය පහත දැක්වෙන සිදුවීම් වලින් යම් සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූවක් විය යුතු ය.

(අ) 3 වන නියෝගය යටතේ දායකයාට සහතිකය නිකුත් කරනු ලැබූ දිනයට පසුව සිදු වූ අනතුරේ දින සිට දින අනූවක් ඇතුළත අබලතාවය ඇති වූ බාහිර සහ දෘෂ්‍යමාන සාහසික ක්‍රියාවක් හේතුවෙන් සිදු වූ අනතුරක් ;

(ආ) 3 වන නියෝගය යටතේ දායකයාට සහතිකය නිකුත් කරනු ලැබූ දිනයට පසුව සිදු වූ රෝගී තත්වයක්.

(4) 3 වන නියෝගය යටතේ දායකයාට සහතිකය නිකුත් කරනු ලැබූ දින සිට වසර එකක් ගතවීමෙන් පසුව පමණක් එකවර ගෙවන මුදල් පාරිතෝෂිකය සඳහා හිමිකම් ලබාගැනීමට දායකයා සුදුස්සකු වන්නේ ය.

(5) අර්ධ හෝ පූර්ණ ස්ථිර අබලතාවයකින් පීඩා විඳිමින් සිටින දායකයකු එකවර ගෙවන මුදල් පාරිතෝෂිකයේ සම්පූර්ණ මුදල් ප්‍රමාණය සහ එම දායකයා විසින් ගෙවනු ලැබූ දායක මුදල්වල සම්පූර්ණ ප්‍රමාණය ඒ මත මණ්ඩලය විසින් නිශ්චය කරන ලද පොළිය ද සමග ලබා ගැනීමට සුදුස්සකු වන්නේ ය.

(6) (5) වන ඡේදය යටතේ එකවර ගෙවන මුදල් පාරිතෝෂිකය ලබාගන්නා යම් දායකයෙකු එම ප්‍රතිලාභ ලබා ගැනීම මත යෝජනා ක්‍රමයේ සාමාජිකයෙකු වීම අවසන් වන්නේ ය.

(7) දායකයකුගේ මරණය පහත දැක්වෙන යම් සිදුවීමක සෘජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් වන්නේ නම් (2) වන ඡේදයේ දක්වා ඇති මරණ පාරිතෝෂිකය ගෙවනු නොලැබිය යුතු ය-

(අ) යුද්ධ ප්‍රකාශ කර තිබුණ ද නොතිබුණ ද එය නොසලකා යුද්ධයක්, ආක්‍රමණයක් හෝ විදේශීය සතුරු ක්‍රියාවන්, සතුරු ක්‍රියාවක්, සිවිල් යුද්ධයක්, කැරැල්ලක්, විප්ලවයක් හෝ කැළඹීමක් ;

(ආ) පිළිගත් ගුවන් සේවයක හෝ කුලී ගුවන් යානයක ගුවන් ගාස්තු ගෙවීමෙන් පසුව ගමන් මගියකු නොවන ආකාරයෙක් ගුවන් ගමනක යෙදීම ;

(ඇ) 3 වන නියෝගය යටතේ දායකයාට සහතික පත්‍රය නිකුත් කරනු ලැබූ දිනයේ සිට වසර 2ක කාලයක් ඇතුළත සිහි ඇතිව හෝ සිහි විකල්ව සියදිවි හානි කර ගැනීම ;

(ඈ) මද්‍යසාර හෝ මාදක ඖෂධවල බලපෑම යටතේ දායකයා විසින් සිදු කරනු ලැබූ යම් ක්‍රියාවක් ;

(ඉ) දායකයා විසින් නීතිවිරෝධී ක්‍රියාවක් සිදුකරමින් සිටිනා අතරතුර හෝ එවැනි යම් ක්‍රියාවක් සිදු කිරීම නිසා නීති බලධරයන්ගේ භාරයේ සිටින අතරතුර.

(8) දායකයාගේ මරණය හදිසි අනතුරක් හේතුවෙන් සිදු වූ අවස්ථාවේ දී හැර 3 වන නියෝගය යටතේ සහතිකය නිකුත් කරනු ලැබූ දිනයේ සිට වසර එකක කාලයක් ඉකුත් වීමෙන් පසුව පමණක් මියගිය දායකයකුගේ උරුමකරුවන් මරණ පාරිතෝෂිතය සඳහා හිමිකම් ඉදිරිපත් කිරීමට සුදුස්සන් බවට පත් වන්නේ ය.

(9) මරණ පාරිතෝෂිකයට අමතරව මියගිය දායකයෙකුගේ උරුමකරුවන් මියගිය දායකයා විසින් ගෙවනු ලැබූ දායක මුදල්වල සම්පූර්ණ ප්‍රමාණය ඒ මත මණ්ඩලය විසින් නිශ්චය කරන පොළිය ද සමග ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ය.

(10) දායකයාගේ මරණය පහත දැක්වෙන යම් සිදුවීමක සෘජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් වන්නේ නම් (1) වන ඡේදයේ දක්වා ඇති මරණ පාරිතෝෂිතය ගෙවනු නොලැබිය යුතු ය-

(අ) යුද්ධ ප්‍රකාශ කර තිබුණ ද නොතිබුණ ද එය නොසලකා යුද්ධයක්, ආක්‍රමණයක් හෝ විදේශීය සතුරු ක්‍රියාවන්, සතුරු ක්‍රියාවක්, සිවිල් යුද්ධයක්, කැරැල්ලක්, විප්ලයක් හෝ කැළඹීමක් ;

(ආ) පිළිගත් ගුවන් සේවයක හෝ කුලී ගුවන් යානයක ගුවන් ගාස්තු ගෙවීමෙන් පසුව ගමන් මගියකු නොවන ආකාරයෙන් ගුවන් ගමනක යෙදීම ;

(ඇ) 3 වන නියෝගය යටතේ දායකයාට සහතික පත්‍රය නිකුත් කරනු ලැබූ දිනයේ සිට වසර 2ක කාලයක් ඇතුළත සිහි ඇතිව හෝ සිහි විකල්ව සියදිවි හානි කර ගැනීම

11. (1) (අ) මණ්ඩලයේ තීරණයක් මගින් සහතිකය අවසන් කිරීම මත ;

(ආ) මේ නියෝගය යටතේ මණ්ඩලයේ යම් තීරණයක් මත

අතෘප්තියට පත් වූ යම් දායකයෙකු විසින් තීරණය ඔහුට ලැබීමේ දින සිට දින තිහක් ඇතුළත අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උප වගන්තියේ කාර්යය සඳහා වූ ආකෘති පත්‍රය මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු අතර, තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය දෙනු ලබන නිලධරයකු වෙත එම ආකෘති පත්‍රය තිබිය යුතු ය.

12. (1) 1987 මැයි මස 7 වැනි දින සහ අංක 452/12 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1987 අංක 1 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳ නියෝග යටතේ නියම කරනු ලැබූ ආකාරයට යෝජනා ක්‍රමයට බැඳුණු දායකයෙකු මේ නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලපවත්වන පරිදි මේ නියෝගවල විධිවිධානවලට යටත්වන අතර නොකඩවා තවදුරටත් යෝජනා ක්‍රමයේ දායකයකු වන්නේ ය.

(2) (1) වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 2014 ජනවාරි මස 1 වැනි දිනට වයස අවුරුදු පනස් පහට අඩු වන (1) වන ඡේදයේ සඳහන් යම් දායකයෙකු විසින් මේ නියෝගවල අ උපලේඛනයේ II වන, III වන සහ IV වන තීරවල නිශ්චිතව දක්වා ඇති පරිදි එම උපලේඛනයේ I වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ඔහුගේ වයසට අදාළව ගෙවනු ලැබිය යුතු දායක මුදලේ ප්‍රමාණය, මේ නියෝග ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව දායකයා විසින් ගෙවනු ලැබ ඇති දායක මුදල් අඩු කිරීමෙන් සංශෝධනය කරනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග ක්‍රියාත්මක වන දිනයේ සිට බල පවත්වෙන පරිදි යෝජනා ක්‍රමයෙන් ඉවත්වීමට කැමති (2) වන ඡේදයේ සඳහන් යම් දායකයකු මේ නියෝග ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ඔහු විසින් ගෙවනු ලැබූ දායක මුදල්වල සම්පූර්ණ ප්‍රමාණය සමග ඒ මත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ පොළිය ද ආපසු ලබැගැනීමට හිමිකම් ලබන්නේ ය.

(4) (1) වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 2014 ජනවාරි මස 1 වැනි දිනට වයස අවුරුදු පනස් පහ හෝ ඊට වැඩි නමුත් අවුරුදු හැටට අඩු යම් දායකයකු විසින් මේ නියෝවල "අ" උපලේඛනයේ II, III වන හා IV වන තීරවල නිශ්චිතව සඳහන් වන පරිදි ඒ උපලේඛනයේ හා I වන තීරයේ නිශ්චිතව සඳහන් කර ඇති ඔහුගේ වයසට අදාළව ගෙවනු ලැබිය යුතු යැයි නිශ්චිතව සඳහන් වන දායක මුදල සියයට පනහකින් අඩුකරනු ලැබිය යුතු ය.

(5) මේ නියෝගය ක්‍රියාත්මක වන දිනයේ සිට බල පවත්වෙන පරිදි යෝජනා ක්‍රමයෙන් ඉවත්වීමට කැමති (4) වන ඡේදයේ සඳහන් යම් දායකයකු මේ නියෝග ක්‍රියාත්මක වන දිනට පෙරාතුව වයස අවුරුදු හැටට එළඹීමේ දී ඔහු විසින් ගෙවනු ලැබූ දායක මුදල්වල සම්පූර්ණ ප්‍රමාණය සමග ඒ මත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ පොළිය ද ලබාගැනීමට හිමිකම් ලබන්නේ ය.

(6) (1) වන ඡේදයේ සඳහන් සෑම දායකයකුට ම වෙනත් දේ අතර, ඔහු විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල හා ඒ ගෙවීම කිරීමට නියමිත දිනය දක්වා ඇති සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, එම දායකයන් මේ නියෝගවල "ආ" උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති විශ්‍රාම ප්‍රතිලාභවලට හිමිකම් ලබන්නේ ය.

13. (1) 1987 මැයි මස 7 වැනි දින සහ අංක 452/12 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1987 අංක 1 දරන ගොවි විශ්‍රාම වැටුප සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳ නියෝග යටතේ නියම කරනු ලැබූ ආකාරයට යෝජනා ක්‍රමයට බැඳුණු සහ 2014 ජනවාරි මස 1 වන දිනයේ දී වයස අවුරුදු හැටට එළඹී සිටින දායකයකුට (2) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව මේ නියෝගවල විධිවිධානවලට අනුකූලව විශ්‍රාම ප්‍රතිලාභ ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(2) අවුරුදු හැටට එළඹීමට පෙරාතුව (1) වන ඡේදයේ සඳහන් දායකයා විසින් ගෙවනු ලැබිය යුතු වූ දායක මුදල්වල හිඟ මුදලක් තිබෙන අවස්ථාවකදී 1987 මැයි මස 7 වැනි දින සහ අංක 452/12 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 1987 අංක 1 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳ නියෝගවල නියම කරනු ලැබූ ආකාරයට අදාළ දායකයා විසින් ගෙවනු ලැබූ දායක මුදල් ප්‍රමාණය සහ මේ නියෝග යටතේ ඔහුගේ වයස අනුව ඒ දායකයා විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදලේ

ප්‍රමාණය අතර වෙනස සැලකිල්ලට ගෙන පහත දැක්වෙන ආකාරයට ඒ දායකයා විසින් මේ නියෝග යටතේ ගෙවනු ලැබිය යුතු දායක මුදල ගණනය කරනු ලැබිය යුතු ය :-

(අ) 2012 ජනවාරි මස 1 වැනි දිනයෙන් ආරම්භ වී 2013 දෙසැම්බර් මස 31 වැනි දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා දායකයාට ගෙවනු ලැබිය යුතු විශ්‍රාම ප්‍රතිලාභවල හිඟ මුදලක් තිබෙන අවස්ථාවක දී දායකයා විසින් මේ නියෝග යටතේ දායක මුදල් වශයෙන් ගෙවනු ලැබිය යුතු යම් හිඟ මුදලක් හිලව් කර ගැනීමෙන් පසුව, ඉතිරි මුදල ගෙවනු ලැබිය යුතු ය ;

(ආ) (අ) ඡේදයේ සඳහන් කර ඇති දායකයාට ගෙවනු ලැබිය යුතු විශ්‍රාම ප්‍රතිලාභ දායකයා විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල්වල හිඟ මුදලට වඩා අඩු වන අවස්ථාවක දී, දායකයාට ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුපෙන් එක් එක් මාසයේ දී රුපියල් පනහක මුදලක් අඩුකර ගැනීම මගින් ඒ හිඟ මුදලෙන් තුනෙන් එකක ප්‍රමාණයක් පමණක් දායකයාගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

14. 1987 මැයි මස 7 වන දින සහ අංක 452/12 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1987 අංක 1 දරන ගොවි විශ්‍රාම මුදල් වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳ නියෝග යටතේ දායක මුදල් වශයෙන් එකවර මුදල් ගෙවනු ලැබූ දායකයකු ඔහු විසින් දැනටමත් එකවර ගෙවනු ලැබ ඇති මුදල් ප්‍රමාණය සහ මේ නියෝගවල විධිවිධාන යටතේ ඔහුගේ වයසට අදාළව ගණනය කරනු ලබන ඔහු විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල අතර වෙනස එම දායකයා විසින් ගෙවනු ලැබීමෙන් පසුව පමණක් මේ නියෝග යටතේ විශ්‍රාම ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබන්නේ ය.

15. කලින් කල සංශෝධිත පරිදි වූ 1987 මැයි මස 7 වැනි දින සහ අංක 452/12 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1987 අංක 1 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳ නියෝග ඒ නියෝග යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

16. මේ නියෝගවල -

"පනත" යන්නෙන්, 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත අදහස් වේ;

"කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය" යන්නෙන්, 1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය පනත අදහස් වේ.

"නීත්‍යානුකූල උරුමකරු" යන්නෙන්, දායකයාගේ ජීවත්ව සිටින භාර්යාව හෝ ස්වාමිපුරුෂයා හෝ එවැනි භාර්යාවක් හෝ ස්වාමියෙක් නොමැති වූ විට පනතේ උපලේඛනයේ ප්‍රමුඛතා අනුපිළිවෙලින් ඒ දායකයාගේ ඥාතීන්ගෙන් එක් අයෙකු පමණක් අදහස් වේ.

"ස්ථිර අර්ධ අබලතාවය" යන්නෙන්,

(i) එක් ඇසක පෙනීම අහිමි වීම ;
(ii) එක් අතක් අහිමි වීම ;
(iii) එක් කකුලක් අහිමි වීම.

අදහස් වේ.

"ස්ථිර පූර්ණ අබලතාවය" යන්නෙන්

(i) අත් දෙකම අහිමි වීම ;
(ii) කකුල් දෙකම අහිමි වීම ;
(iii) ඇස් දෙකේම පෙනීම අහිමි වීම ;
(iv) එක් අතක් හා එක් කකුලක් අහිමි වීම ;
(v) එක් කකුලක් හා එක් ඇසක පෙනීම අහිමි වීම ;
(vi) එක් අතක් හා එක් ඇසක පෙනීම අහිමි වීම ;
(vii) බෙල්ලට පහළ කොටස සම්පූර්ණයෙන් අප්‍රාණික වීම.

අදහස් වේ.

අ උපලේඛනය

(6 වැනි නියෝගය)

| I වන තීරය | II වන තීරය | III වන තීරය | IV වන තීරය |
|---|---|---|---|
| යෝජනා ක්‍රමයට බැඳීමෙන් පසු ඊළඟ උපන් දිනයේ දී වයස | එකවර ගෙවන දායක මුදල (රු.) | මාසික දායක මුදල (රු.) | ආර්ධ වාර්ෂික දායක මුදල (රු.) |
| 18 | 3628 | 27 | 160 |
| 19 | 3960 | 30 | 175 |
| 20 | 4323 | 32 | 191 |
| 21 | 4718 | 35 | 209 |
| 22 | 5149 | 39 | 229 |
| 23 | 5619 | 43 | 251 |
| 24 | 6132 | 47 | 275 |
| 25 | 6692 | 51 | 301 |
| 26 | 7302 | 56 | 330 |
| 27 | 7969 | 62 | 363 |
| 28 | 8695 | 68 | 398 |
| 29 | 9488 | 74 | 437 |
| 30 | 10353 | 82 | 481 |
| 31 | 11297 | 90 | 529 |
| 32 | 12328 | 99 | 582 |
| 33 | 13453 | 109 | 641 |
| 34 | 14682 | 120 | 707 |
| 35 | 16024 | 133 | 781 |
| 36 | 17490 | 147 | 864 |
| 37 | 19093 | 162 | 956 |
| 38 | 20846 | 180 | 1060 |
| 39 | 22763 | 200 | 1177 |
| 40 | 24860 | 222 | 1310 |
| 41 | 27155 | 248 | 1460 |
| 42 | 29668 | 277 | 1632 |
| 43 | 32421 | 311 | 1829 |
| 44 | 35439 | 349 | 2056 |
| 45 | 38749 | 394 | 2319 |
| 46 | 42380 | 446 | 2627 |
| 47 | 46269 | 508 | 2990 |
| 48 | 50755 | 581 | 3422 |
| 49 | 55580 | 670 | 3942 |
| 50 | 60983 | 778 | 4577 |
| 51 | 66749 | 912 | 5365 |
| 52 | 73210 | 1082 | 6366 |
| 53 | 80349 | 1304 | 7671 |
| 54 | 88246 | 1603 | 9431 |

අ උපලේඛනය (සම්බන්ධිතයි)

(6 වැනි නියෝගය)

| I වන තීරය | II වන තීරය | III වන තීරය | IV වන තීරය |
|---|---|---|---|
| යෝජනා ක්‍රමයට බැඳීමෙන් පසු ඊළඟ උපන් දිනයේ දී වයස | එකවර ගෙවන දායක මුදල (රු.) | මාසික දායක මුදල (රු.) | ආර්ධ වාර්ෂික දායක මුදල (රු.) |
| 55 | 96991 | 2027 | 11922 |
| 56 | 106684 | 2668 | 15692 |
| 57 | 117445 | 3745 | 22023 |
| 58 | 129415 | 5911 | 34756 |
| 59 | 142756 | 12435 | 73104 |

ආ උපලේඛනය

(6 වන නියෝගය)

| I වන තීරය | II වන තීරය |
|---|---|
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා හිමිකම ලබන වයස | මාසික විශ්‍රාම වැටුප (රු.) |
| 60 - 63 | 1,000.00 |
| 64 - 70 | 1,250.00 |
| 71 - 77 | 2,000.00 |
| 78 හෝ ඊට වැඩි | 5,000.00 |

ඇ උපලේඛනය

(10 වන නියෝගය)

| I වන තීරය | II වන තීරය | III වන තීරය | IV වන තීරය |
|---|---|---|---|
| අබලතාවයකට පත්වීම හෝ මරණයට පත්වීමේ දිනෙන් පසු ඊළඟ එළඹෙන උපන් දිනයේ දී වයස | ස්ථිර පූර්ණ අබලතාවය | ස්ථිර අර්ධ අබලතාවය | මරණය |
| අවුරුදු | (රු) | (රු) | (රු) |
| 30ට වැඩි | 50,000 | 25,000 | 25,000 |
| 31 - 35 | 40,000 | 20,000 | 20,000 |
| 36 - 40 | 30,000 | 15,000 | 15,000 |
| 41 - 45 | 20,000 | 10,000 | 10,000 |
| 46 - 60 | 12,000 | 6,000 | 6,000 |

03-999

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.